**ඉමදූව ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

---------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 06 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 20 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 11 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය**

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ඉමදූව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---------------------------------------

**1.3.1 උසස් ගිණුම්කරණ පරිචයන්**

-------------------------------

සභාව සතු මාවැල්ල ආදාහනාගාර ඉඩමෙහි කුරුඳු වගාව සම්බන්ධ මෙහෙයුම් ප්‍රතිඵලය දැක්වීම සඳහා වෙනම ගිණුමක් ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වත්කම් බැරකම් බෙදාදීමේ කමිටුවේ නිර්දේශය මත හබරාදූව ප්‍රාදේශීය සභාව විසින් ඉමදූව ප්‍රාදේශීය සභාවට පැවරිය යුතු ලෙසට තීරණය කර තිබූ රු.9,794,393 ක වත්කම් හා රු.2,051,704 ක බැරකම් පාදක කරගෙන ගිණුම් පිළියෙල කර තිබුණ ද, 2015 ජූලි 07 දින වන විටත් අදාළ වත්කම් හා බැරකම් නීත්‍යානුකූලව ප්‍රාදේශීය සභාව වෙත පවරාගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ වැටුප් ප්‍රතිපූර්ණය ලෙස පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබූ රු.14,862,248 ක් සියලු වැඩසටහන් අතර විභජනය නොකර, එක් වැඩසටහනක් යටතේ දක්වා තිබුණි.

(ඇ) 2012 වර්ෂය වෙනුවෙන් විගණන ගාස්තු ලෙස රු.40,656 ක් ගෙවා තිබුණ ද, සමාලෝචිත වර්ෂයේදී ද ඒ වෙනුවෙන් රු.45,000 ක ප්‍රතිපාදන සලසා තිබීමෙන් ණයහිමියන් හා වියදම් රු.45,000 බැගින් වැඩියෙන් දැක්විණි. තවද මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ සේවකයන්ගේ වැටුපෙන් අය කරන ලද රු.36,000 ක පුස්තකාල සේවක ඇප තැන්පත් ආයෝජනය කර නොතිබුණි.

(ඉ) රදාකෙත, කොස්දුවකෙත, හඳුන්කෙත, මිල්ලගහකෙත අක්කර 07 යි පර්චස් 15 ක ඉඩම පවරා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් රු.2,280,000 ක් සහ සභා අරමුදලින් රු.570,000 ක් ඉමදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර තිබුණ ද, එය ආරක්ෂිත තැන්පතුවක් ලෙස නොදක්වා ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් සමාලෝචිත වර්ෂයේ දී ලැබී තිබුණු රු.119,000 ක මුද්දර ගාස්තු ආදායම සඳහා මූල්‍ය ප්‍රකාශනවල බිල් කිරීම් කර නොතිබීමෙන් මුද්දර ගාස්තු ආදායම රු.119,000 කින් අඩුවෙන් දැක්විණි.

(උ) රු.97,001 ක් වටිනාකම වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ, යන්ත්‍ර හා උපකරණ යටතේ දක්වා තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් රු.97,001 කින් වැඩියෙන් දැක්විණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දී දරා තිබුණු රු.135,592 ක් වූ ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(එ) 2014 මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ රු.97,846 ක් වූ කර්මාන්තයක් සඳහා සහ 2014 පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ රු.847,045 ක් වූ කර්මාන්ත 02 ක් සඳහා ලැබිය යුතු හා ගෙවිය යුතු ලෙස ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් ණයගැතියන් හා ප්‍රාග්ධන ආදායම් සහ ණයහිමියන් හා ප්‍රාග්ධන වියදම් රු.944,891 බැගින් අඩුවෙන් දැක්විණි.

(ඒ) රු.1,000,000 ක් වටිනාකම වූ කහඳ පාසල් මාවත සංවර්ධනය කිරීම කර්මාන්තය සංශෝධනය කර රු.500,000 බැගින් කර්මාන්ත 02 ක් යටතේ මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු හා ගෙවිය යුතු ලෙස ප්‍රතිපාදන සලසා තිබීමෙන් ණයගැතියන් හා ප්‍රාග්ධන ආදායම් සහ ණයහිමියන් හා ප්‍රාග්ධන වියදම් රු.1,000,000 බැගින් වැඩියෙන් දැක්විණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත 17 ක් සඳහා ලැබිය යුතු ආධාර මුදල රු.7,645,255 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.10,450,000 ක් වශයෙන් ප්‍රතිපාදන සලසා තිබීමෙන් රු.2,804,745 බැගින් ණයගැතියන් හා ප්‍රාග්ධන ආදායම් වැඩියෙන් දැක්විණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත 14 ක් සඳහා ගෙවිය යුතු ආධාර මුදල රු.5,734,407 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.6,172,227 ක් වශයෙන් ප්‍රතිපාදන සලසා තිබීමෙන් රු.437,820 බැගින් ණයහිමියන් හා ප්‍රාග්ධන වියදම් වැඩියෙන් දැක්විණි.

(ක) හබරාදූව ප්‍රාදේශීය සභාවේ සමාලෝචිත වර්ෂයට අදාළව ලැබෙන උසාවි දඩ ආදායම බිල් කර නොතිබූ අතර අදාළ සභාවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස උසාවි දඩ ලෙස රු.36,342 ක් ලැබිය යුතු වුවද, රු.50,000 ක් ලෙස ඇස්තමේන්තුගතකර තිබීමෙන් උසාවි දඩ ආදායම රු.13,658 ක අධි බිල් කිරීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද, රු.299,685 ක ඌන බිල් කිරීමක් ලෙස දැක්වීමෙන් උසාවි දඩ ආදායම රු.313,343 කින් වැඩියෙන් දැක්විණි.

**1.3.3 නොසැසඳු පාලන ගිණුම්**

----------------------------

ගිණුම් විෂයයන් 04 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.466,413 ක වෙනසක් පැවතුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.161,865,148 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු, පිඹුරුපත්, සමීක්ෂණ මණ්ඩල වාර්තා, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, තුලනය කරන ලද තැන්පත් ලේඛනය, උපලේඛන, යාවත්කාලීන කරන ලද ණය ලේඛනය, කාල විශ්ලේෂණය, විධිමත්ව පවත්වාගෙන යනු ලබන ණයහිමි හා ණයගැති ලේඛන, ශේෂ සනාථ සහතික, විධිමත්ව පවත්වාගෙන යන අත්තිකාරම් ලේඛනය, විධිමත්ව පවත්වාගෙන යන සේවක ණය ලේඛනය සහ ණයගැති තහවුරු ලිපි පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

**2. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.3,111,523 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,211,494 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

----------------------

**2.2.1 වරිපනම් බදු**

----------------

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂවල ප්‍රාදේශීය සභාවට අයකර ගතයුතුව තිබූ රු.269,062 ක වරිපනම් බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුලදී ද කටයුතු කර නොතිබුණි.

**2.2.2 අක්කර බදු**

------------

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂවල ප්‍රාදේශීය සභාවට අයකර ගතයුතුව තිබූ රු.47,380 ක අක්කර බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුලදී ද කටයුතු කර නොතිබුණි.

**2.2.3 බලපත්‍ර ගාස්තු**

----------------

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂවල සභාවට අයකර ගතයුතු රු.442,566 ක් වූ බලපත්‍ර ගාස්තු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්ති ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුලදී ද කටයුතු කර නොතිබුණි.

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.4,250 ක උසාවි දඩ හා රු.10,502,957 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 බලය නොළත් ගනුදෙනු**

**විදේශ අධ්‍යයන චාරිකා**

ප්‍රාදේශීය සභා අරමුදල යෙදවීම පිළිබඳ නීතිමය ප්‍රතිපාදන සලසා ඇති 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියේ දැක්වෙන කාර්යයන් යටතට නොගැනෙන කාර්යයක් වූ විදේශ අධ්‍යයන චාරිකා තුනක් සඳහා රු.1,179,688 ක් ප්‍රාදේශීය සභා අරමුදලින් වැයකර තිබුණි. එකී විදේශ ගමන් සඳහා විධිමත් අනුමැතියක් ද ලබාගෙන නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

1988 අංක 74 දරන (සංශෝධන) පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව 2014 වර්ෂය සඳහා සභාවේ සභාපතිවරයා හැර සෙසු සභිකයින් 08 දෙනා විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**3.3.1 ඇසළ අසිරිය වැඩසටහන**

මෙම වැඩසටහන සඳහා රු.400,272 ක් වැය කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය යටතේ 2014 නොවැම්බර් 19 දින විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා දී තිබුණි.

විගණනය සඳහා ඉදිරිපත් වූ තොරතුරු අනුව වැඩසටහන සඳහා මුළු වියදම රු.798,309 ක් වුවද, රු.400,272 ක වියදම් සඳහා පමණක් වවුචර් ඉදිරිපත් කරන ලද අතර රු.398,037 ක වියදම් සනාථ කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

**3.3.2 ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන**

2014 අයවැය යෝජනා අනුව ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ ප්‍රාදේශීය සභාව වෙත රු.7,000,000 ක් අනුමත වී තිබුණි. විගණන දිනය වූ 2015 ජනවාරි 21 වන විට රු.4,000,000 ක් ලැබී තිබුණ ද, ව්‍යාපෘති 02 ක කටයුතු ආරම්භ කර නොතිබුණි. ඉමදූව කෝදාගොඩ මාතෘ සායන ආයුර්වේද හා පුස්තකාල ගොඩනැගිල්ලේ කැඩුණු කොටස් අළුත්වැඩියා කිරීම හා වහල ගලවා තහඩු යොදා, සිවිලිම සවිකර තින්ත ආලේප කිරීම සඳහා

රු.248,575 ක් හා වාහන අළුත්වැඩියා හා නඩත්තු සඳහා රු.343,591 ක් වශයෙන් රු.592,166 ක් වියදම් දරා තිබුණි. ඉතිරිය වූ රු.3,407,834 ක් අදාළ බැංකු ගිණුම්වල ශේෂව නොමැති බැවින් එම මුදල් අදාල ව්‍යාපෘති සඳහා භාවිතා නොකර වෙනත් වියදම් සඳහා යොදාගෙන තිබූ බව විගණනයේ දී නිරීක්ෂණය විය.

### 3.3.3 ඡායා පිටපත් යන්ත්‍රය මිලදී ගැනීම

2014 දෙසැම්බර් 31 දින රු.134,800 ක් වැයකර පුද්ගලික ආයතනයකින් KYOCER වර්ගයේ ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 208 අනුව රු.50,000 ඉක්මවනු ලබන මිලදී ගැනීම් සම්බන්ධයෙන් ටෙන්ඩර්කරුවන් විසින් කියවනු ලැබෙතැයි සිතෙන දිනපතා පුවත්පත්වල අදාල ටෙන්ඩර් දැන්වීම් පල කළයුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) රීති 210 පරිදි සභාවේ හෝ ටෙන්ඩර් කමිටුව වෙත මිල ගණන් ඉදිරිපත් කර, සලකා බැලිය යුතු බව දක්වා තිබුණ ද, මෙම මිලදී ගැනීම සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 3.4 නිෂ්ක්‍රීය වත්කම්

2013 ජූනි මස 05 දිනැති අංක : පීසීඑම්ඩී/පීආර්/2013 ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය පරිදි ආයතනය තුළ ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින පැරණි වාහන හා යන්ත්‍රෝපකරණ 2013 සැප්තැම්බර් 05 දින වනවිට අපහරණය කිරීමට වැඩපිළිවෙලක් සකස් කරන ලෙස උපදෙස් දී තිබුණි. එසේ වුවද, රු.1,959,000 ක් වූ වාහන 03 ක් ප්‍රයෝජනයට ගතහැකි තත්ත්වයට අළුත්වැඩියා කිරීමට හෝ ජනාධිපති ලේකම්වරයාගේ උපදෙස් ලිපිය පරිදි අපහරණය කිරීමට විගණන දින වූ 2015 ජනවාරි 21 වන විටත් කටයුතු කර නොතිබුණි.

## 3.5 හඳුනාගත් අලාභ

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය විසින් 2014 නොවැම්බර් මාසය තුළදී 1" ගැල්වනයිස් බට 600 ක් සභාව වෙත ලබා දී තිබුණි.

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) සභාව වෙත ලැබී තිබුණු ගැල්වනයිස් බට 600 ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. එම බටවලින් බට 150 ක් 2015 මාර්තු 31 දින හබරාදුව ප්‍රාදේශීය සභාව වෙත ලබා දී තිබුණි.

(ii) 2015 අප්‍රේල් 02 සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී ඉමදුව ප්‍රාදේශීය සභාව සතුව බට 303 ක් ද 2015 අප්‍රේල් 06 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේ දී හබරාදුව ප්‍රාදේශීය සභාව සතුව බට 150 ක් ද පැවති බව තහවුරු විය.

(iii) මේ අනුව සභාවට ලබා දී තිබූ 1" ගැල්වනයිස් බට 600 න් බට 147 ක ඌනතාවයක් පැවතුණි. ඒ අනුව බට ඌනතාවයේ වටිනාකම රු.162,729 ක් විය.

**3.6 ආදාහනාගාරය ඉදිකිරීම**

---------------------------

ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය ඉදිකිරීමේ කටයුතු සඳහා 2007 අගෝස්තු 08 දින පුද්ගලික සමාගමක් සමඟ ගිවිසුම් අත්සන් කර වැඩ ආරම්භ කර තිබූ අතර, ගිවිසුම අනුව 2008 පෙබරවාරි 09 දින වනවිට වැඩ අවසන් කළ යුතුව තිබුණි. විගණන දිනය වූ 2015 ජනවාරි 21 දින වනවිට ද ආදාහනාගාරයේ වැඩ අවසන් කර නොතිබුණි. ව්‍යාපෘතිය වෙනුවෙන් රු.10,155,015 ක් වැයකර තිබුණි.

2007 වර්ෂයේ විශේෂ ව්‍යාපෘති යටතේ ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතියෙහි විගණන දින වනවිට වසර 06 ක කාල ප්‍රමාදයක් නිරීක්ෂණය විය. මේ අනුව මෙකී ව්‍යාපෘතියෙන් සභා බලප්‍රදේශයේ ජනතාව වෙත ලබා දීමට අපේක්ෂිත සේවාව ලබාදීමට සභාව අපොහොසත් වී තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---------------------------------------

**අයවැය පාලනය**

------------------

අයවැය ලේඛනයෙහි ඇස්තමේන්තුගත සහ තථ්‍ය වශයෙන් ලැබූ ආදායම් අතර විචලනයන් පවතින බවත්, ඇතැම් වියදම් විෂයයන්වල ඉතිරි කිරීම් තිබූ බවත් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන ඇති බවක් නිරීක්ෂණය නොවුණි.

**5. පද්ධති හා පාලන**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය